# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,513 — 1965 සැප්තැම්බර් 24 වැනි සිකුරාද — 1965.9.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස — අධිකරණ

(මෙහි මෙකම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 115 |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත්කිරීම ... ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම ... ... | 115 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දැන්වීම ... ... ... | — |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍රවිනිශ්චයකාර ධුරන්ධර මිලියානි ක්ලෝඩ් සන්සෝනි වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා, එයට සෑහෙන කරුණු පෙනී, ශ්‍රේෂ්ඨාධිකරණයේ බටහිර චාරිකාව සඳහා 1965 ඔක්තෝබර් මස 11 වැනි සඳුදා සිට කොළඹදී පැවැත්වීමට නියමිත අපරාධ අධිකරණ වාරයට අමතරව, එදින සිට මීගමුවේදී තවත් අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

එම්. සී. සන්සෝනි,
අග්‍රවිනිශ්චයකාර,

1965 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දීය.

9-934

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍රවිනිශ්චයකාර ධුරන්ධර මිලියානි ක්ලෝඩ් සන්සෝනි වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා, එයට සෑහෙන කරුණු පෙනී, ශ්‍රේෂ්ඨාධිකරණයේ බටහිර චාරිකාව සඳහා 1965 ඔක්තෝබර් මස 11 වැනි සඳුදා සිට කොළඹදී පැවැත්වීමට නියමිත අපරාධ අධිකරණ වාරයට අමතරව, එදින සිට කළුතරදී තවත් අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීම නියෝග කරමි.

එම්. සී. සන්සෝනි,
අග්‍රවිනිශ්චයකාර.

1965 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දීය.

9-933

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### මධ්‍යම පළාත

#### මහනුවර දිස්ත්‍රික් උසාවියේ දීය

නොම්මරය : ඇල්. 6180.

උඩුනුවර ගඟපලාතේ ගෙලිඔය "ජයසිරිනිවසෙහි" පදිංචි දෙන් එඩ්වින් ජයසූරිය ........................................ පැමිණිලිකාරයා

නොම්මරය : ඇල්. 6180. එදිරිව

මහනුවර මුල්ගම්පොල හීරස්සගල පාරේ "ජයසිරිනිවසෙහි" පදිංචි ජයසූරිය ආරච්චිගේ දෙන් බර්ටි ජයසූරිය නොහොත් ජෝර්ජ් ජයසූරිය නොහොත් ඩී. බී. ජයසූරිය............විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහතකී නඩුවේ ඉහත සඳහන් විත්තිකරුට පහත සඳහන් දේපලවලට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්‍ෂ 1965ක්වූ ඔක්තෝබර් මස 26 දින උදේ 11 ට එකී ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදන බව මෙයින් දන්වනු ලැබේ. රුපියල් 355ක් හා අනෙකුත් මුදල් ඇතුළු පවුන්ඩේජ් මුදල් ආදිය අය කර ගැනීම සඳහායි :—

එනම් :—

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟවට කෝරලේ සියඹලාගස්පිටියේ පිහිටි වී ලාස් දොළහක වපසරිය ඇති බෝගොඩ වත්ත නැමැති ඉඩමෙන් දකුණින් පිහිටි වී තිඹක වපසරියෙන් දකුණින් පිහිටි වී දෙලහක වපසරියෙන් නොබෙදූ තුනෙන් පංගුවක් සහ එහි තුල තිබෙන උළු සෙවිලි කර තිබෙන ගෙයින් සහ අනෙකුත් සියලු දෙයිනුත් එකී පංගුවක් වේ. මෙකී වී දෙළහක වපසරියට මායිම් : උතුරට : වලව්වේ වත්තේ ඉම; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසේ පාර; දකුණට : බූත් මහතාට අයිති ඉඩමේ මායිම් සහ බස්නාහිරට : වලව්වේ වත්තේ ඉමද වේ.

ර. ම. ජ. රත්නායක,
ම. ප. පිස්කල් වෙනුවට,

1965ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
මහනුවර පිස්කල් කාර්‍යාලයේ දීය.

9-1038

